# GMOA

ESTABLISHED IN 1926
TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION

No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk


11-10-2012

**මාධ්‍ය නිවේදනය**

ශ්‍රී ලංකා රාජ්‍ය වැටුප් කොමිසම මගින් රාජ්‍ය සේවයේ වැටුප් නියාමනය කරනු ලබයි. මෙම කොමිසම මගින් විද්‍යානුකූල ක්‍රමයට අනුගතව සියළුම රාජ්‍ය සේවයන් නියමිත වු වැටුප් තල වල පිහිටුවා ඇත. නමුත් පහළම සහ ඉහළම ශ්‍රේණි අතර වැටුප් පරතරය 1:4 මට්ටමේ පැවතිම නිසා රාජ්‍ය සේවයේ සියළුම අංශ බරපතල අර්බුදයන්ට මුහුණ දි ඇත.

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය ඉහත ගැටළුව නැවත නැවතත් පෙන්වා දි ඇති අතර 1:12 වැටුප් අනුපාතයකට යොමු වීම තුලින් මෙම ගැටළුව නිරාකරණය කර ගැනිමට හැකි බව පෙන්වා දි ඇත. මුදල් අමාත්‍යාංශයද රාජ්‍ය වැටුප් කොමිසමද මෙම වැටුප් අර්බුදයට විසඳුමක් 1:12 වැටුප් අනුපාතය තුලින් ලබා ගත හැකි බව පිලිගෙන ඇත. රජය මෙම කරුණු දැඩි අවදානයට යොමු කර ඉහත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කල යුතු බව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය අවධාරණය කරන අතර සාධාරණ වැටුප් වැඩි වීමක් සිදු නොවුවහොත් දැඩි වෘත්තිය සමිති ක්‍රියාමාර්ගයට යොමුවීමට සිදු විය හැකි බව අවධාරණය කරමු.

තවද සියළුම රජයේ වෛද්‍යවරුන්ට ප්‍රවාන පහසුකම් ලබා දිම 22/99 චක්‍රලේකය මගින් රජය බැඳි සිටි. වෛද්‍යවරුන්ට සම ශ්‍රේණිවල සිටින අනෙකුත් වෘත්තිකයන්ට මෙය දිර්ඝකාලයක සිට බුක්ති විඳි.

හදිසි හා අත්‍යවශ්‍ය සේවාවන් ඉටු කරන වෛද්‍යවරයන් මෙම පහසුකම් ලැබීමට ඉහලින්ම සුදුසුකම් ලබන කාණ්ඩය වුවද දැනට එය නොලැබෙන වෘත්තිය කාණ්ඩය වන්නේද වෛද්‍යවරුන්ම වීම අතිශය කණගාටුදායක තත්ත්වයකි.

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය මෙය පිලිබඳව දැඩි අවධානය යොමු කර ඇති අතර රෝගි සත්කාර සේවයේ ගුණාත්මකභාවය හා කාර්යක්ෂමතාවය ආරක්ෂා කිරීම සඳහා වහාම 22/99 චක්‍රලේකයට අනුව වෛද්‍යවරුන්ගේ ප්‍රවාහන පහසුකම් සපයන මෙන් ඉල්ලා සිටිමු.

ඉතිහාසය පුරාම බොහෝ විට වෘත්තිය ගැටළුව සාකච්ජාමය පියවර මගින් සාර්ථකව විසඳා ගන්නා ලදි නමුත් වර්තමානයේ වෘත්තිය සමිති ක්‍රියාමාර්ග වලට අවතිරණ වීමකින් තොරව ගැටළුව විසඳාගැනිමට නොහැකි තත්ත්වය උදා වී ඇත. මෑත දි අප රට තුල සිදුවු සිදු වීම් ඒ සඳහා උදාහරණයන් වේ.

ශ්‍රී ලංකාවේ වෛද්‍යවරුන් දැඩි පිඩනයක් හා කලකිරීම් මැද්දේ වුවද තවමත් කාර්යක්ෂම හා ගුණාත්මක රෝගි සත්කාර සේවයන් අඛණ්ඩව ලබා දෙයි. නමුත් රජය වෛද්‍යවරුන්ගේ මුලික ගැටළුව තවදුරටත් නොසලකා හරිමින් කටයුතු කරන්නේ නම් අකමැත්තනේ වුවද මී ලඟ සති දෙක ඇතුලත හදිසි වෘත්තිය සමිති ක්‍රියාමාර්ග යොමු වීමට විධායක සභාව මගින් තිරණය කර ඇති අතර මෙම වෘත්තිය සමිති ක්‍රියාමාර්ගය තුලින් රෝගි සත්කාරයන්ගේ සිදු වන බිඳවැටීම් පිලිබඳ සියළුම වගකීම් අදාළ බලධාරීන් විසින් භාරගත යුතු බව අප අවධාරණය කර සිටිමු.

ස්තුතියි

වෛද්‍ය නලින් ආරියරත්න
සහකාර ලේකම්

වැඩි විස්තර - වෛද්‍ය නලින් ආරියරත්න 0714800942

වෛද්‍ය නවීන් ද සොයිසා 0718582444